
# 18 සුරනිමල වීරයා

පොදු ජනතාව උදෙසා රසවත් කතා ඉදිරිපත් කිරීමට පැරණි සිංහල ගද්‍ය කවීහු උත්සාහ ගත්හ. මෙහි දී ඔවුන් තෝරා ගෙන ඇත්තේ බණ කතා, චරිත කතා හා වෙනත් සිදුවීම් ආශ්‍රිත කතා ය. ඔවුන් ඉදිරිපත් කළ ඇතැම් කතාවල ශ්‍රී ලංකාවේ සමාජ තොරතුරු ද ඇතුළත් වේ. මෙසේ දේශීය තොරතුරු ඇතුළත් කතා ඉදිරිපත් කළ අය අතර සද්ධර්මාලංකාර කතුවර දෙවන ධර්මකීර්ති මාහිමියෝ කැපී පෙනෙති. සද්ධර්මාලංකාරයෙන් උපුටා ගත් නිර්මල හෙවත් සුරනිමල යෝධයා පිළිබඳ කතාව උන්වහන්සේගේ කතා රීතිය මෙන් ම ශ්‍රී ලංකාවේ පැරණි වීරවරයන්ගේ ස්වරූපය මොනවට විදහා දක්වන්නකි.

ඒ නිර්මල නම් යෝධයාණන් දසදෙළොස් හැවිරිදි අවස්ථාවෙහි කාවන්තිස්ස රජ්ජුරුවෝ මහවැලි ගඟ ඒ ඒ තොටවල රකවල් ලවා තමන්ගේ අනික් බිසෝකෙනකුන් වැදූ දීඝාභය නම් රාජකුමාරයන් කසාතොට රකවලට සිටුවූහ; ඒ රාජකුමාරයෝ වටින් සයොත්නක් පමණ තැන ඒ ඒ ගම්වල නායක කුලවලින් එකි එකී කුලයෙන් එකි එකී කෙනකුන් බැගින් සේවයට ගෙන්වන්නාහු සංඝ නම් කෙළෙඹියාණන් ළඟට දූතයකු යවූහ. ඒ කෙළෙඹියාණෝ ගිය දූතයාගේ බස් අසා තමන්ගේ පුතුන් සත්දෙනා කැඳවා "තොප සත්දෙනා අතුරෙන් රාජකුමාරයන් වහන්සේ ළඟට සේවයට යන්නෝ කවුරුහුදැ" යි විචාළහ. එකල වැඩිමහලු සබෑයෝ කියන්නාහු "නුඹගේ බාල පුතණුවෝ නිර්මලයෝ යහපත් පිළී දෙකක් ඔඩුක්කු තබා වලු එල්වා ඇඳගෙන මිහිරි කොට බත අනුභවකොට ලා අවුසුළං ඇඟ නොගස්වා කිසි කර්මාන්තයකුත් නොකොට සැපසේ ගෙට වැදලා ඉඳිති, අපි හැම වෙළෙඳාම් නවාම් ගොවිතැන් බත් කෙරෙමින් දුග්ගෙන වසම්හ, සේවාකමට යවතොත් නිර්මලයන් ම යවුව මැනව, අපි නො යම්හ"යි කීහ. එකල කෙළෙඹියාණෝ නිර්මලයන්ට ම ගමන් භාර කළහ. නිර්මලයෝ වැඩිමහලු සබෑයන්ට කිපී උදෑසන්හි ම පිටත් ව දෙළොස් ගවු පමණ දුරු කතර ගෙවා ගොස් ඉර පායන වේලාවට ම රාජ කුමාරයන් දුටහ. රාජ කුමාරයෝ "කවර ද ගමින් පිටත්වූ දැ" යි විචාරා "උදෑසන ම පිටත් ව ආමි " කී කල්හි විස්මය පත් ව ඔහු විමසනු පිණිස "එසේ කල සගය, සෑගිරි සමීපයෙහි ද්වාරමණ්ඩල නම් ගම මාගේ යහළු වූ කුණ්ඩල නම් බමුණු වෙසෙයි, දේශාන්තරයෙන් ගෙනා සඳුන් සුවඳ කස්තුරි කපුරු තුවරලා පිළී ආදි වූ වස්තුවෙන් උන් දුන් දෙයක් වහා ඇරගෙන එව"යි මෙහෙවර කියා කවා පොවා පතක් ලියා දී නික්ම වූහ.

එකල නිර්මලයෝ පත් අස්න ගෙන නවයොදුන් මඟ ගෙවා ද්වාරමණ්ඩල නම් ගමට පෙරවරු ම ගොස් බ්‍රාහ්මණයාණන් දුටුවු ය; බමුණාණෝ ඔහු දැක "කසා තොටින් කවර ද පිටත් ව අවු දැ" යි විචාරා "අද ඔබදී බත් කාලා ආමි" කී කල්හි "එසේ වී නම් දරුව, වැවට ගොස් නහාපියා එව" යි නික්මවූහ. එකල නිර්මලයෝ පළමු තමන් අඳුනන



තැනක් නොවන හෙයින් වැව කොතන බවත් නො දන අනුරාධපුරයෙහි තිසාවැවට ගොස් ඉස්සෝධා නහා එයින් අවුත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද ථූපාරාමය ද මල් පුදා වැඳ ප්‍රදක්ෂිණා කොට ඇතුළු නුවරට වැද ඒ ඒ වීථිවල ඇවිද සල්පිල්වලින් සුවඳසුනු සුවඳමල් ආදිය ගෙන සුවඳ ඇඟ ගල්වා මල් පැලඳ ඒ නුවර උතුරු වහසල් දෙරින් පිටත් ව මානෙල් කෙතින් මානෙල් මල් කඩා ගෙන පෙරළා නුවරට වැද නැගෙනහිරි වහසලින් පිටත් ව පෙරවරු ම බමුණාණන් ළඟට ගියහ. එකල බ්‍රාහ්මණයා විසින් "දරුව, කොයි ගියා ද" යි විචාළ කල්හි නිර්මලයෝ තමන් ගිය තැන් සියල්ල ම කීහ. බමුණාණෝ එපවත් අසා "මේ මහා සමර්ථ වූ උත්තම පුරුෂයෙකැ"යි විස්මයට පැමිණ, "කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයෙහි වසන්ට සුදුසු ය"යි සිතා තමන් ඒ සිතූ පරිද්දෙන් පත් ලියා දී බත් කවා පූර්ණවර්ධන නම් පිළි සඟළක් ද, කස්තුරි, කපුරු, සඳුන් ආදිය ද ඕහට පාවා දී රාජකුමාරයන් සමීපයට නික්මවූහ. නිර්මලයෝ ඒ සියල්ල ම ඇරගෙන පස්වරු රාජකුමාරයන් සමීපයට ගොස් බමුණාණන් දුන් පඬුරු හා සමග ලියා දුන් පත දුන්හ.

අභය රාජකුමාරයෝ එවූ පඬුරු හා පත් අස්න දැක කියවා බලා සතුටු ව "මෝහට මසුරන් දහසක් දෙව"යි කීහ. එබස් අසා රාජකුමාරයන්ගේ සේවකයෝ "ස්වාමිනි, මේ බාල දරුවන් කළ සපන්කමට දෙන්නේ අනිස මසුරන් දහසෙක් ද; ඒ උන්ට තරම් නොවෙ" යි කීහ. එබස් අසා රාජකුමාරයෝ දසදහසක් මසුරන් දී ඔහු ඉස කෙස් බහවා දැලිරැවුළු කප්පවා ඉස්සෝධා නහවා බමුණාණන් තමන්ට එවූ පූර්ණවර්ධන නම් පිළිසඟළ අඳවා සුවඳමල් සුවඳසුනු ආදින් අලංකාර කොට සරහා ඉස දුහුල් සළුවෙන් වෙළා තමන් අනුභව කරන පරිද්දෙන් ම බත් කවා තමන්ගේ දසදහසක් අගනා මාහැඟි සයනයක් දුන්හ. නිර්මලයෝ තමන්ට දුන් ඒ සියල්ල ම එක්කොට බැඳ කිසිල්ලෙහි තබා ගෙන ගොස් මසුරන් දසදහස ම මෑණියන්ට දී පියාණන්ට දසදහසක් අගනා සයනය දී එදවස් රාත්‍රියෙහි ම අවුත් තමන්ට නියම වූ තැන රැකවල් ගත්හ. රාජකුමාරයෝ රාත්‍රිය පහන් වූ කල එපවත් අසා සතුටු ව නැවත වස්ත්‍රාභරණ හා මසුරන් දසදහසක් ද පරිවාර ජනයන් ද සලස්වා කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයට යවූහ. එකල නිර්මලයෝ තමන් ලත් ඒ සියල්ල ද දෙමාපියන්ට දී එදවස් ම මාගමට ගොස් කාවන්තිස්ස රජ්ජුරුවන් දුටහ.

### අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| අනිසය | - | නොවටිනා |
| ඔඩුක්කු | - | අඳින ලද වස්ත්‍රයෙහි ඉඟෙන් එල්ලෙන රෙදි කොන සහිත කොටස |
| කෙළෙඹියාණන් | - | පවුලේ ප්‍රධානියා/ගෘහ මූලිකයා/ධනවත් පුද්ගලයා |
| තුවරලා | - | සුගන්ධ ද්‍රව්‍යයක් |
| ප්‍රදක්ෂිණා කොට | - | පැදකුණු කොට (ගෞරව කරන පූජ්‍ය ස්ථාන වටා දකුණු අත ඇතුළු පැත්තට සිටින සේ ගමන් කිරීම) |
| නවාම් | - | අලුත්/නව කර්මාන්ත |
| රකවලට | - | ආරක්ෂාවට |
| විස්මය පත් ව | - | පුදුමයට පත් ව |
| සබෑයෝ | - | සහෝදරයන් හය දෙනා |
| සමර්ථ | - | දක්ෂ |
| සයනය | - | ඇඳ |
| සයොත්නක් | - | යොදුන් හයක් |

## ක්‍රියාකාරකම 01

(i). මෙම පාඩම ශබ්ද නගා ශ්‍රැති ගෝචර ශෛලියට අනුව කියවන්න.

## ක්‍රියාකාරකම 02

(i). මේ කථාව කියවා එහි ඇතුළත් ප්‍රධාන අවස්ථා අනුපිළිවෙළින් ලියා දක්වන්න.
(ii). මෙම කථාවේ තේමාව කුමක්දැයි පැහැදිලි කරන්න.
(iii). කථාවේ ප්‍රධාන චරිතය නම් කර ඔහුගේ සහෝදරයන් පිළිබඳ තොරතුරු විස්තර කරන්න.
(iv). **'සුරනිමල කාය බලයෙන් පිරිපුන් පුද්ගලයකු වුවත් දෙමව්පියන්ට සලකන බෙහෙවින් ම කීකරු පුද්ගලයෙකි'** මේ කියමන තහවුරු කිරීමට කතාවෙන් දැක්විය
හැකි උදාහරණ මොනවා ද?

## ක්‍රියාකාරකම 03

(i). රාජ්‍ය සේවය සඳහා නිර්මල නම් බාල සොහොයුරා යැවිය යුතු බව සනාථ කරමින් වැඩිමහල් සොයුරන් ඉදිරිපත් කළ හේතු දක්වන්න.
(ii). රාජ කුමාරයා විසින් නිර්මල, කුණ්ඩල බමුණා වෙත යැවීමේ අරමුණ පැහැදිලි කරන්න.
(iii). කුණ්ඩල බමුණා ඔබයැයි සිතා නිර්මල පිළිබඳ ව ඔබේ අදහස් දක්වා අභය කුමාරයා වෙත යැවීමට සුදුසු ලිපියක් ලියන්න.
(iv). නිර්මලගේ චරිතයෙන් හෙළි වන උතුම් ගුණාංග කවරේදැයි පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 04

**මෙම පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න.**

1. "සේවාකමට යවතොත් නිර්මලයන් ම යවුව මැනව"
   - i. මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
   - ii. කවුරුන්හට ද?
   - iii. නිර්මලයන් යවන්ට කීවේ කවර ස්ථානයකට ද?

2. "එසේ වී නම් දරුව, වැවට ගොස් නහාපියා එව"
   i. මෙසේ පැවසුවේ කවරෙක් ද?
   ii. කවරෙකුට ද?
   iii. නෑමට ගියේ කොතැනකට ද?

3. "ස්වාමීනි මේ බාල දරුවන් කළ සපන්කමට දෙන්නේ අනිසය මසුරන් දහසෙක් ද? ඒ උන්ට තරම් නො වෙයි"
   i. මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
   ii. 'ස්වාමීනි' යනුවෙන් ආමන්ත්‍රණය කළේ කාහට ද?
   iii. මෙම ප්‍රකාශය කවුරුන් අරභයා කරන ලද්දක් ද?

## ක්‍රියාකාරකම 05

සුරනිමල වීරයා බඳු වෙනත් ශ්‍රී ලාංකික වීරයන් පිළිබඳ කතා පුවත් ඇතුළත් කොට බිත්ති පුවත්පතක් සකස් කරන්න.


## ක්‍රියාකාරකම 06

**මහාප්‍රාණ අක්ෂර**

සිංහල භාෂාවේ අල්පප්‍රාණ, මහාප්‍රාණ යනුවෙන් අක්ෂර වර්ග දෙකකි. අඩු හඬකින් උච්චාරණය කරන අක්ෂර අල්පප්‍රාණ ලෙස ද තරමක් ගැඹුරු, බර හඬකින් උච්චාරණය කරන අක්ෂර මහාප්‍රාණ ලෙස ද හැඳින්වේ. මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර 10කි. එම අක්ෂර යෙදෙන වචන කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| **ඛ** | - | **ඛාදනය** | **ඝ** | - | **ඝර්මකලාපීය** |
| **ඡ** | - | **ඡායාව** | **ඣ** | - | **මජ්ඣිම** |
| **ඨ** | - | **පාඨශාලාව** | **ඪ** | - | **ආරූඪ** |
| **ථ** | - | **ථූල්ලතිස්ස** | **ධ** | - | **ධර්මය** |
| **ඵ** | - | **ඵුස්සදේව** | **භ** | - | **භද්‍රාවතී** |

පහත සඳහන් රූපය අභ්‍යාස පොතේ ඇඳ ගන්න. කුඩා වෘත්තයේ තිබෙන අක්ෂර අතුරෙන් නිවැරදි අක්ෂරය තෝරා ලොකු වෘත්තයේ කොටුවල ඇති වචන නිවැරදි ව සම්පූර්ණ කරන්න.




**සුදුසු මහාප්‍රාණ අක්ෂර යොදා මේ වාක්‍යවල හිස්තැන් පුරවන්න.**

(i) අප ගන්නා ආහාරයෙහි .......නිජ පදාර්ථ අඩංගු විය යුතු ය.

(ii) වැසි වැටෙන්නට පෙර මේ...... වලාවෝ අහස පුරා විසිරුණහ.

(iii) මහජන නියෝජිතයෝ උදෑසන ම ......න්ද පොළ කරා පිය නැගූහ.

(iv) පිරිත් සජ්......යනාවට භික්ෂූන් වහන්සේ පෙරහැරින් වැඩම කළහ.

(v) අපේ පා.....ශාලාවේ සමහර ගොඩනැගිලි අලුත්වැඩියා කළ යුතු ව ඇත.

(vi) කුඩා දරුවන්ගේ ක්‍රීඩා දෙස බලා සිටි විදුහල්පතිතුමාගේ මුවගට සිනාවක් ආරූ...... විය.

(vii) බුදුරජාණන් වහන්සේගේ දහම් අසා තීර්......කයෝ බුදු දහම වැළඳගත්හ.

(viii) සෑම පුරපසළොස්වක පොහෝ දිනක ම අප පාසලේ ......ර්ම දේශනාවක් පැවැත්වේ.

(ix) අපි විභාග ප්‍රති......ල අපේක්ෂාවෙන් නො ඉවසිල්ලෙන් සිටිමු.

(x) මධ්‍යම රාත්‍රියේ නැගුණු ......යානක ශබ්දයෙන් මුළු ගම ම ඇළලී ගියේ ය.

## ක්‍රියාකාරකම 07

**විරාම ලක්ෂණ**

ලිවීමේ දී අදහස් නිරවුල් ව හා පැහැදිලි ව ප්‍රකාශ කිරීම සඳහා නම් විරාම ලක්ෂණ යෙදිය යුතු ය. එසේ නො වුවහොත් ප්‍රකාශ කරන අදහස් අවුල් සහගත වේ. විරාම ලක්ෂණ සම්බන්ධයෙන් පිළිගත් සම්මතයක් ඇත. ඒවා හඳුනා ගෙන විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරන්න.

**වරහන්**

සරල වරහන් **( )**

සම්පූර්ණ ප්‍රකාශනයක දී යම් තැනක අර්ථය පැහැදිලි කිරීම සඳහා යොදන වචනයක්, වාක්‍යය ඛණ්ඩයක් හෝ වාක්‍යයක් යෙදීමේ දී එය පැහැදිලි කිරීම සඳහා වරහන යෙදේ.

**පහත සඳහන් නිදසුන් විමසා බලන්න.**

- ගොවිජන සේවා කොමසාරිස්තුමා, ශ්‍රී ලංකාවේ ගොවිතැන (ගොඩ, මඩ) නගා සිටුවීම සඳහා නූතන තාක්ෂණය යොද ගැනීම පිළිබඳ ව අගනා දේශනයක් පැවැත්වී ය.
- බොහෝ රටවල පවතින ආර්ථික දුෂ්කරතා නිසා අපේ අපනයන (මෙරටින් පිටරටට යවන) භාණ්ඩ සඳහා ඉල්ලුම අඩු වී ඇත.
- නිමි ඇඳුම් (මසා නිම කළ ඇඳුම්) කර්මාන්තය නිසා අපේ රටට විදේශ මුදල් විශාල ප්‍රමාණයක් ලැබේ.

**කාක පාදය**

කාක පාදය ^

ලේඛනයේ දී මග හැරුණු අකුරක්, පදයක් හෝ වාක්‍ය ඛණ්ඩයක් ඇතුළත් කිරීම සඳහා එම ස්ථානය දැක්වීමේ දී අදාළ තැන මෙය යෙදේ.

**නිදසුන්**

- ර<br>ධර්මත්න මහතා අද පාසලට පැමිණ නැත.<br>^
- පෙළ<br>අපට ලැබෙන පොත්වලින් නිසි ප්‍රයෝජන ලබමු.<br>^

**තිත් පෙළ**

(තිත් තුන **...** සහ තිත් හතර **....**)

තිත් තුන **...**

කිසියම් උද්ධෘත පාඨයකින් මුල හෝ මැද හෝ කොටසක් අත්හළ බව දැක්වීම සඳහා තිත් තුන යෙදේ.

**නිදසුන්**

- **...** ව්‍යායාමය රජ සැප පිණිස නොවේ.
- අහසින් වැටෙන **...** මුහුදට යා නො දිය යුතු ය.

ප්‍රකාශයක හිස්තැන් දැක්වීම සඳහා ද තිත් තුන යෙදේ.

**නිදසුන**

- පාසලේ සිට නිවසට කිලෝ මීටර් **...** කි.

අදහසක් අවධාරණය සඳහා ද තිත් තුන යෙදේ.

**නිදසුන**

- මහා වැස්සක**...** කුණාටුවක**...** ලකුණු පහළ වෙමින් පවතී.

තිත් හතර (**....**) උද්ධෘත පාඨයකින් අග කොටස අත්හළ බව දැක්වීමට මෙය යෙදේ.


**නිදසුන්**

- හඳපානේ හඳපානේ **....**
- මා වැනි බිළින්ද
  වර වර **....**
  දුක්සැප කුමන්ද **....**

**කුණ්ඩලිය** 

පුස්කොළ පොත්වල වාක්‍යාවසානය දැක්වීම සඳහා යෙදුණු ලකුණ කුණ්ඩලිය නම් වේ.

පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් ඇති විරාම ලක්ෂණවලට ගැළපෙන නිවැරදි නම **'අ'** අක්ෂරය සඳහන් කොටුව තුළින් තෝරා ලියන්න.




පෙර
(i) පනින්ට ^ සිතා බලනු

(ii) අධ්‍යාපන චාරිකාව සඳහා ලං**.**ග**.**ම**.** **(**ලංකා ගමනාගමන මණ්ඩලය**)**ට අයත් බස් රථයක් ලබා ගන්නා ලදි.

(iii) සියලු ගිහි පැවිදි උතුමන් ස්තුති පූර්වක ව සිහිපත් කරම්හ ෴

(iv) තොටිල්ලෙ සැම සුව පිරී
පැද්දෙයි තාලෙට සරී
අසමින් ගී සුමිහිරි
නිදන්න **....**

(v) බිඳෙන් බිඳෙන් **...** පයිප්පයෙන් වැටේ.